ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2017 මැයි මස 25 වැනි දින |

## 2017 පෙබරවාරි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

2017 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වීම, සංචාරක ඉපැයීම් පහළ යෑම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල මධ්‍යස්ථ වර්ධනය සමඟ ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තවදුරටත් මන්දගාමීව පැවතුණි. අපනයන පහළ යෑම සහ ප්‍රධාන වශයෙන් ඉන්ධන සහ සහල් ආනයනය ඉහළ යෑම හේතුවෙන් සමස්ත ආනයන වියදම ඉහළ යෑම මධ්‍යයේ පෙබරවාරි මාසයේ දී වෙළඳ හිඟයේ සැලකිය යුතු පුළුල් වීමක් වාර්තා විය. පෙබරවාරි මාසය තුළ දී සංචාරක පැමිණීම් සුළු වශයෙන් අඩුවීමත් සමඟ සංචාරක ඉපැයීම් පහළ ගිය අතර, ධාවන පථය අළුත්වැඩියා කිරීමේ කටයුතු වෙනුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ දිවා කාලයේ දී වසා තැබීම ඒ සඳහා යම් තරමකට හේතු විය. පෙබරවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්හි වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු මට්ටමක පැවතුණි. තවද, මෙම මාසය තුළ දී රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් සැලකිය යුතු ගෙවීම් වාර්තා වීම මූල්‍ය ගිණුම වෙත අහිතකර බලපෑමක් ඇති කළේය. කෙසේ වෙතත්, මාසය තුළ දී ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ වෙත වූ ලැබීම් සමඟ කොළඹ කොටස් වෙළඳපොළෙහි යම් විදේශීය ආයෝජන ප්‍රමාණයක් වාර්තා විය.

එනමුදු, විදේශීය අංශය වෙත වූ පීඩනය 2017 පෙබරවාරි මාසයට පසු කාලපරිච්ඡේදය තුළ සිදු වූ අපනයන ක්‍රියාකාරිත්වයෙහි වැඩිදියුණු වීම, කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ආයෝජන සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ ලැබීම් මෙන්ම එ.ජ. ඩොලර්

බිලියන 1.5 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සහ එ.ජ. ඩොලර් මිලියන 450 ක ඒකාබද්ධ ණය මුදල තුළින් යම් තරමකට ලිහිල් විය.

**අපනයන ක්‍රියාකාරිත්වය**

ප්‍රධාන වශයෙන්ම කාර්මික අපනයන අඩුවීම හේතුවෙන් 2016 වසරේ පෙබරවාරි මාසයේ එ.ජ. ඩොලර් මිලියන 892 ක් වූ අපනයන ආදායම 2017 වසරේ පෙබරවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 868 ක් දක්වා සියයට 2.7 කින් පහළ ගියේය.

මුළු අපනයන ආදායමෙන් සියයට 76 ක් පමණ වූ කාර්මික අපනයන ආදායම, 2017 වසරේ පෙබරවාරි මාසයේ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 659 ක් දක්වා සියයට 6.5 කින් පහළ ගිය අතර, රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. යුරෝපා සංගමය හා ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ ඇඟලුම් අපනයනවල කැපී පෙනෙන පහළ යෑමක් පිළිඹිබු කරමින් 2017 පෙබරවාරි මාසයේ දී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 396 ක් දක්වා සියයට 14.5 කින් පහළ ගියේය. ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම් අඩුවීම ද කාර්මික අපනයන ආදායම අඩුවීමට සැලකිය යුතු ලෙස බලපෑවේය. කෙසේ වුවද, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, ඛනිජතෙල් නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත අපනයන ආදායමෙහි වර්ධනයක් දක්නට ලැබිණි.

මේ අතර, 2017 පෙබරවාරි මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම අඛණ්ඩව තෙවැනි මාසයටත් වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 205 ක් දක්වා සියයට 12.5 කින් වර්ධනය විය. අපනයන පරිමාව අඩුවුවද, අපනයන මිල ගණන්වල ඉහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම සියයට 12.8 කින් ඉහළ ගියේය. කරාබු නැටි, සාදික්කා, වසාවාසිවල අපනයන මිල ගණන් පහළ මට්ටමක පැවතියද, අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් 2017 පෙබරවාරි මාසයේ කුළුබඩු අපනයන ආදායම සියයට 25.7 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මීට අමතරව, ප්‍රධන වශයෙන්ම යුරෝපා සංගමය වෙත මුහුදු ආහාර අපනයනය කිරීමෙන් ලද ආදායම සියයට 111.0 කින් ඉහළ යෑම හේතුවෙන් 2017 පෙබරවාරි මාසයේ දී මුහුදු ආහාර අපනයන ආදායම සියයට 27.3 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, 2017 පෙබරවාරි මාසයේ දී පොල්, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ එළවළු අපනයන ආදායම් පහළ ගියේය.

සමුච්චිත වශයෙන් සැලකූවිට, ප්‍රධාන වශයෙන්ම රෙදිපිළි හා ඇඟලුම්, ආහාර, පාන වර්ග සහ දුම්කොළ, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ සහ රබර් නිෂ්පාදිත අපනයන පහළ යෑම නිසා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ පළමු මාස දෙක

තුළ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,733 ක් දක්වා සියයට 3.2 කින් පහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, තේ සහ කුළුබඩු අපනයන ආදායම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

2017 වසරේ පළමු මාස දෙක තුළ, ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයනය සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය ප්‍රධාන වෙළඳපොළ වූ අතර, එම රටවල් වෙත සිදුකළ අපනයන මුළු අපනයන ආදායමෙන් සියයට 52 ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2016 පෙබ. (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන-පෙබ. (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 ජන-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **705.3** | **659.4** | **(6.5)** | **1,421.5** | **1,327.4** | **(6.6)** |
| රෙදිපිළි හා ඇඟලුම් | 463.1 | 396.1 | (14.5) | 927.5 | 822.4 | (11.3) |
| එයින් ඇඟලුම් | 436.9 | 371.0 | (15.1) | 878.5 | 776.2 | (11.6) |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 0.4 | 2.6 | 549.2 | 2.3 | 7.3 | 212.5 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 24.5 | 37.6 | 53.4 | 45.2 | 63.6 | 40.7 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 18.5 | 27.2 | 47.3 | 47.1 | 56.7 | 20.4 |
| රබර් නිෂ්පාදිත | 60.2 | 64.8 | 7.7 | 131.5 | 122.8 | (6.6) |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 12.1 | 16.3 | 34.6 | 24.4 | 25.7 | 5.3 |
| රසායනික නිෂ්පාදිත | 10.4 | 10.3 | (0.6) | 20.6 | 21.3 | 3.1 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත උපාංග | 5.6 | 5.1 | (9.5) | 11.5 | 9.7 | (15.7) |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.7 | 22.6 | (8.5) | 55.3 | 44.4 | (19.8) |
| ආහාර පාන හා දුම්කොළ | 34.4 | 23.7 | (31.2) | 60.0 | 45.7 | (23.8) |
| වෙනත් | 51.5 | 53.1 | 3.1 | 96.1 | 107.9 | 12.3 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **182.1** | **204.9** | **12.5** | **361.6** | **398.5** | **10.2** |
| තේ | 101.0 | 113.9 | 12.8 | 200.4 | 215.5 | 7.5 |
| පොල් | 28.2 | 27.2 | (3.7) | 52.7 | 54.5 | 3.4 |
| කුළුබඩු | 20.1 | 25.3 | 25.7 | 42.9 | 55.7 | 30.0 |
| මුහුදු ආහාර | 14.7 | 18.8 | 27.3 | 30.0 | 37.0 | 23.5 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 9.3 | 8.6 | (7.8) | 18.8 | 15.9 | (15.8) |
| රබර් | 3.3 | 5.6 | 71.7 | 6.7 | 10.6 | 58.0 |
| සකස් නොකළ දුම්කොළ | 3.1 | 3.7 | 20.1 | 5.9 | 5.8 | (2.1) |
| එළවළු | 2.4 | 1.8 | (24.5) | 4.2 | 3.6 | (13.3) |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **4.2** | **3.6** | **(14.4)** | **7.1** | **6.6** | **(6.9)** |
| **මුළු අපනයන** | **891.6** | **867.8** | **(2.7)** | **1,790.2** | **1,732.5** | **(3.2)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

**ආනයන ක්‍රියාකාරිත්වය**

2017 වසරේ පෙබරවාරි මාසයේ ආනයන වියදම අඛණ්ඩව පස්වැනි මාසයටත් අංක දෙකක වර්ධනයක් පෙන්නුම් කරමින්, පෙර වසරේ අනුරූප මාසය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 1,611 ක් දක්වා සියයට 11.9 කින් ඉහළ ගියේය. අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම මෙම වර්ධනය සඳහා විශාල ලෙස දායක විය.

2017 පෙබරවාරි මාසයේ අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 907 ක් දක්වා සියයට 25.3 කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ඉන්ධන ආනයන වියදම ඉහළ යෑමයි. මෙම මාසය තුළ ඉන්ධන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 355 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසය හා සැසඳීමේ දී දෙගුණයකට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. පවතින නියං තත්ත්වය සමඟ ඉහළ ගිය තාප විදුලි බල උත්පාදනය සඳහා පිරිපහදු කළ ඛනිජතෙල් ආනයන ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූ අතර, බොරතෙල් සහ ගල් අඟුරු ආනයන වියදම් ද ඉහළ ගියේය. ජාත්‍යන්තර තෙල් මිල ගණන් ඉහළ යෑමත්, රුපියලෙහි අගය අවප්‍රමාණය වීමත් ඉන්ධන ආනයන වියදම ඉහළ යෑමට දායක විය. මීට අමතරව, යකඩ හා වානේ අමුද්‍රව්‍ය, සහ රත්‍රං ආනයන වියදම් ඉහළ යෑමද, අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑමට කැපී පෙනෙන ලෙස දායක විය. කෙසේ වුවද, රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පහළ යෑමත් සමඟම 2017 වසරේ පෙබරවාරි මාසයේ දී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ද සියයට 17.1 කින් පහළ ගියේය.

ප්‍රධාන වශයෙන්ම, යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයනය පහළ යෑම හේතුවෙන් 2017 වසරේ පෙබරවාරි මාසයේ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 360 ක් දක්වා සියයට 2.5 කින් පහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම, විදුලි සන්දේශ උපකරණ ආනයනය පහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම සියයට 5.9 කින් පහළ ගියේය. ත්‍රී රෝද රථ, වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා කැබ් රථ සහ බස් රථ වැනි වාහන ආනයනය පහළ යෑම මූලික කොටගෙන ප්‍රවාහන උපකරණ ආනයන වියදම සියයට 4.8 කින් පහළ ගියේය. කෙසේ වුවද, යකඩ හා වානේ ආනයනය ඉහළ යෑම හේතුවෙන් මෙම මාසය තුළ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඉහළ ගියේය.

2017 පෙබරවාරි මාසයේ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 343 ක් දක්වා සියයට 0.7 කින් සුළු වශයෙන් පහළ ගියේය. ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ පෞද්ගලික රථවාහන, ගෘහ උපකරණ සහ රෙදිපිළි හා උපාංග වැනි ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය පහළ යෑමයි.

මෙයට වෙනස්ව යමින්, ප්‍රධාන වශයෙන්ම සහල් ආනයනය ඉහළ යෑම හේතුවෙන් ආහාර හා පාන වර්ග ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2016 වසරේ පෙබරවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1 ට අඩු අගයක පැවැති සහල් ආනයන වියදම හා සැසඳීමේ දී 2017 වසරේ පෙබරවාරි මාසයේ සහල් ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 36 ක් දක්වා ඉහළ ගියේය.

සමුච්චිත වශයෙන් සැලකූවිට, ප්‍රධාන වශයෙන්ම ඉන්ධන, රත්‍රං සහ සහල් ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ පළමු මාස දෙක තුළ ආනයන වියදම 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ ආනයන වියදම හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 3,410 ක් දක්වා සියයට 12.6 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ රෙදිපිළි හා රෙදිපිළි උපාංග, රථවාහන සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම් පහළ ගියේය.

2017 වසරේ පළමු මාස දෙක තුළ ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභවයන් වූ අතර, මෙම රටවල් වෙතින් සිදු කරන ලද ආනයන මුළු ආනයනවලින් සියයට 59 ක් පමණ විය.


## සංඛ්‍යා සටහන 2: ආනයන වියදම (අ)


| කාණ්ඩය | 2016 පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2017 පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **345.6** | **343.2** | **(0.7)** | **689.1** | **702.0** | **1.9** |
| ආහාර හා පානවර්ග | 122.6 | 148.1 | 20.8 | 241.2 | 291.7 | 20.9 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.3 | 37.1 | 2,770.5 | 3.1 | 49.8 | 1,496.5 |
| එළවළු | 37.5 | 28.1 | (25.1) | 81.8 | 66.8 | (18.4) |
| කිරි නිෂ්පාදිත | 19.9 | 26.5 | 33.5 | 37.9 | 47.6 | 25.5 |
| මුහුදු ආහාර | 19.3 | 14.1 | (26.6) | 35.2 | 32.3 | (8.2) |
| කුළුබඩු | 9.9 | 6.5 | (34.3) | 20.7 | 15.9 | (23.1) |
| තෙල් සහ මේද | 1.8 | 3.2 | 83.7 | 4.7 | 7.5 | 61.0 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 33.0 | 32.6 | (1.3) | 57.8 | 71.8 | 24.3 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 223.0 | 195.1 | (12.5) | 447.9 | 410.3 | (8.4) |
| රථවාහන | 64.5 | 51.3 | (20.4) | 151.4 | 117.3 | (22.5) |
| විදුලි සන්දේශ උපකරණ | 15.9 | 20.7 | 30.1 | 33.3 | 42.8 | 28.2 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 142.6 | 123.1 | (13.7) | 263.1 | 250.2 | (4.9) |
| **2. අන්තර් භාණ්ඩ** | **724.0** | **907.4** | **25.3** | **1,525.2** | **1,857.5** | **21.8** |
| ඉන්ධන | 148.8 | 354.6 | 138.3 | 323.6 | 636.8 | 96.8 |
| එයින් බොරතෙල් | 25.0 | 84.2 | 237.3 | 70.3 | 125.6 | 78.7 |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 100.2 | 213.8 | 113.4 | 201.7 | 418.5 | 107.5 |
| ගල්අඟුරු | 23.7 | 56.6 | 139.1 | 51.7 | 92.7 | 79.5 |
| දියමන්ති සහ අගනා ගල් හා ලෝහ වර්ග | 38.9 | 54.4 | 40.1 | 63.6 | 123.4 | 94.2 |
| එයින් රත්‍රන් | 25.3 | 46.6 | 84.4 | 40.7 | 110.8 | 171.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 225.0 | 186.6 | (17.1) | 475.9 | 439.6 | (7.6) |
| රසායනික නිෂ්පාදිත | 70.2 | 62.1 | (11.5) | 138.7 | 131.8 | (5.0) |
| මූල ලෝහ | 26.2 | 52.5 | 100.2 | 57.1 | 90.9 | 59.1 |
| ආහාර සැකසුම් | 16.1 | 21.1 | 31.6 | 37.3 | 43.1 | 15.5 |
| තිරිඟු හා ඉරිඟු | 10.2 | 13.1 | 28.8 | 53.2 | 43.8 | (17.7) |
| පොහොර | 16.4 | 9.0 | (45.5) | 28.2 | 13.1 | (53.5) |
| වෙනත් | 172.2 | 153.9 | (10.6) | 347.5 | 334.9 | (3.6) |
| **3. ආයෝජන භාණ්ඩ** | **369.4** | **360.3** | **(2.5)** | **813.4** | **792.5** | **(2.6)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 210.2 | 197.8 | (5.9) | 465.7 | 448.4 | (3.7) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 105.9 | 111.9 | 5.6 | 240.8 | 247.8 | 2.9 |
| ප්‍රවාහන උපකරණ | 52.8 | 50.2 | (4.8) | 105.4 | 94.5 | (10.3) |
| වෙනත් | 0.5 | 0.4 | (28.0) | 1.4 | 1.8 | 26.5 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.3** | **0.2** | **(30.8)** | **0.8** | **57.5** | **6,976.0** |
| **මුළු ආනයන** | **1,439.3** | **1,611.2** | **11.9** | **3,028.4** | **3,409.6** | **12.6** |

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

**රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

**වෙළඳ ශේෂය**

2017 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ හිඟය, 2016 වසරේ පෙබරවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 548 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 743 ක් දක්වා සැලකිය යුතු ලෙස පුළුල් විය. 2017 වසරේ පළමු මාස දෙක තුළ සමුච්චිත වෙළඳ හිඟය, 2016 වසරේ පළමු මාස දෙක තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 1,238 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 1,677 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**සංචාරක ඉපැයීම්**

2017 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ 197,517 ක සංචාරක පැමිණීම් සංඛ්‍යාව 2016 වසරේ අනුරූප මාසයේ දී පැමිණි සංචාරකයින් සංඛ්‍යාව වූ 197,697 සමඟ සැසඳීමේ දී සියයට 0.1 ක අඩු වීමක් වාර්තා කරයි. සංචාරක පැමිණීම්වල සුළු අඩුවීම සඳහා චීනයෙන් පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය අඩුවීම විශාල වශයෙන් හේතු විය. එනමුදු, ඉන්දියාව, එක්සත් ජනපදය, ජර්මනිය යන රටවලින් පැමිණි සංචාරකයින් ප්‍රමාණයෙහි ඉහළ යෑමක් වාර්තා වූ අතර, ප්‍රංශයෙන් පැමිණි සංචාරකයින් ප්‍රමාණයෙහි අඩු වීමක් වාර්තා විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ධාවන පථය අළුත්වැඩියා කිරීමේ කටයුතු හේතුවෙන් ගුවන් ගමන් සමහරක් අවලංගු වීම සහ සමහර ගුවන් ගමන් කාලසටහන් වෙනස් කිරීම, 2017 පෙබරවාරි මාසයේ දී සංචාරක පැමිණීම් වෙත යම් බලපෑමක් ඇති කළේය. කෙසේ වෙතත්, නැගෙනහිර යුරෝපා කලාපයෙන් වූ සංචාරකයින් සංඛ්‍යාව වැඩිවීම 2017 වසරේ පළමු මාස දෙක තුළ දී සංචාරක පැමිණීම්වල කැපී පෙනෙන

ලක්ෂණයක් විය. සංචාරක පැමිණීම් අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස, 2017 පෙබරවාරි මාසයේ දී සංචාරක ඉපැයීම් ද එ.ජ. ඩොලර් මිලියන 338.9 දක්වා පහළ ගියේය.[1]

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2017 පෙබරවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් තවදුරටත් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. 2017 පෙබරවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම්, එ.ජ. ඩොලර් මිලියන 568.7 ක් වූ අතර එය පෙර වසරේ අනුරූප මාසයේ වූ අගය හා සැසඳීමේ දී සියයට 2.6 ක සුළු වර්ධනයකි. මැද පෙරදිග කලාපයේ පවතින අහිතකර ආර්ථික හා දේශපාලණික තත්ත්වයන් නිසා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණයන්හි අඩු වර්ධන ප්‍රවණතාව තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

**මූල්‍ය ලැබීම්**

2017 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 255.9 ක සැලකිය යුතු ශුද්ධ ගෙවීමත් සමඟ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ තුළ පැවැති ශුද්ධ ගෙවීමේ ප්‍රවණතාවය අඛණ්ඩව පැවැතුණි. තවද, පෙබරවාරි මාසය තුළ දී රජයේ දිගුකාලීන ණය, එ.ජ. ඩොලර් මිලියන 57.6 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, එය එ.ජ. ඩොලර් මිලියන 149.2 ක ණය ආපසු ගෙවීම්වලින් ද, එ.ජ. ඩොලර් මිලියන 91.6 ක ණය ලැබීම් වලින් ද සමන්විත විය. කෙසේ වුවත්, කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 57.2 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, එය ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 14.2 කින් හා ද්විතීයික වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 43.0 කින් සමන්විත විය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2017 පෙබරවාරි මාසයේ දී සමස්ත ගෙවුම් තුලනය 2016 වසරේ පෙබරවාරි අවසානයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 534.0 ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 258.3 ක හිඟයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2017 වසරේ පෙබරවාරි මස අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 3.4 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 5.6 ක් විය. දළ නිල සංචිතවලින් හා තැන්පතු භාරගන්නා ආයතන සතු විදේශීය වත්කම්වලින් සමන්විත මුළු

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2017 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 4.7 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 7.8 ක් විය.

2016 වසරේ දී එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 3.8 ක අවප්‍රමාණය වීමක් වාර්තා කළ ශ්‍රී ලංකා රුපියල 2016 වසර අවසානයේ සිට 2017 මැයි මස 23 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී, තවදුරටත් සියයට 1.8 ක අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතිකවල හැසිරීම පිළිබිඹු කරමින් 2017 මැයි මස 23 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යුරෝවලට එරෙහිව සියයට 8.0 කින් ද, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 6.7 කින් ද, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 7.1 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 6.2 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 5.1 කින් සහ කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 1.7 කින් ද අවප්‍රමාණය විය.

### සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2016 පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2017 පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 891.6 (ආ) | 867.8 | -2.7 | 1,790.2 (ආ) | 1,732.5 | -3.2 |
| ආනයන | 1,439.3 | 1,611.2 | 11.9 | 3,028.4 | 3,409.6 | 12.6 |
| වෙළඳ ශේෂය | -547.7 (ආ) | -743.4 | 35.7 | -1,238.2 (ආ) | -1,677.0 | 35.4 |
| සංචාරක ඉපැයීම් | 339.2 (ආ) | 338.9 | -0.1 | 672.5 (ආ) | 715.2 | 6.4 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 554.2 | 568.7 | 2.6 | 1,117.6 | 1,140.3 | 2.0 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 8.8 | 57.2 | 551.1 | -10.1 | 46.2 | 557.4 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) එයින්, | 53.8 (ආ) | 223.0 | 314.8 | 144.2 (ආ) | 438.3 | 203.9 |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 9.7 | 129.9 | 1,234.2 | 23.0 | 212.8 | 826.5 |
| දිගුකාලීන ණය | 43.9 (ආ) | 91.6 | 108.8 | 116.5 (ආ) | 223.6 | 91.9 |

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ඒකාබද්ධ ණය පහසුකම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.